අල්ලාහ්ගේ දූතයාණන් හා එතුමාණන්ගේ මිතුරන් මක්කාවට පැමිණි කල්හි දේව ආදේශකයෝ ‘නියත වශයෙන්ම මදීනාවෙහි උණ වැළඳුනු එමෙන්ම එය ඔවුන් දුර්වලතාවයට පත් කළ පිරිසක් නුඹලා වෙත පැමිණෙයි.’ යැයි පැවසුවෝය. එවිට එතුමාණෝ වට තුන ඉක්මණින් ගමන් කරන්න යැයි ද (හජරුල් අස්වද් හා රුක්නුල් යමානි හෙවත්) ප්රධාන ස්ථාන දෙක අතර (සාමාන්ය අයුරින්) ගමන් කරන්නැයි ඔවුනට අණ කළහ.

අබ්දුල්ලාහ් ඉබ්නු අබ්බාස් -රළියල්ලාහු අන්හුමා- තුමා විසින් වාර්තා කරන ලදී. අල්ලාහ්ගේ දූතයාණන් හා එතුමාණන්ගේ මිතුරන් මක්කාවට පැමිණි කල්හි දේව ආදේශකයෝ ‘නියත වශයෙන්ම මදීනාවෙහි උණ වැළඳුනු එමෙන්ම එය ඔවුන් දුර්වලතාවයට පත් කළ පිරිසක් නුඹලා වෙත පැමිණෙයි.’ යැයි පැවසුවෝය. එවිට එතුමාණෝ වට තුන ඉක්මණින් ගමන් කරන්න යැයි ද (හජරුල් අස්වද් හා රුක්නුල් යමානි හෙවත්) ප්රාධාන ස්ථාන දෙක අතර
(සාමාන්ය අයුරින්) ගමන් කරන්නැයි ඔවුනට අණ කළහ. ඒ සියලු වටයන්හි ඔවුන් අතර කාරුණික
ලෙස කටයුතු කරනු වස් මිස ඔවුන් ඉක්මණින් ගමන් කිරීමෙන් වෙන කිසිවක් වැළැක්වූයේ
නැත.
[පූර්ව සාධක සහිත හදීසයකි] [බුහාරි හා මුස්ලිම් හි වාර්තා වී ඇත]

හිජ්රි හයවන වසරේ උම්රා කිරීම සඳහා නබි -සල්ලල්ලාහු අලය්හි වසල්ලම්- තුමා එතුමාගේ අනුගාමිකයින් බොහෝ දෙනෙක් සමග මක්කාවට පැමිණියේය. එවිට කුරෙය්ෂ් කාෆිර්වරු එතුමාණන් සමග සටන් කිරීම සඳහාත් බය්තුල්ලාවෙන් එතුමාව වළක්වාලීම සඳහාත් පිටතට පැමිණියේය. පසුව ඔවුන් අතර සාම ගිවිසුමක් ඇති විය. එහි නබි -සල්ලල්ලාහු අලය්හි වසල්ලම්- තුමා හා එතුමාගේ අනුගාමිකයින් මෙම වසරේ හැරී යා යුතු බවත් එළැඹෙන වසරේ උම්රා කිරීම සඳහා පැමිණිය යුතු බවත් මක්කාවේ දින තුනක් පමණක් රැඳී සිටිය යුතු බවත් සඳහන් විය. ඒ අනුව අතපසු වූ උම්රා ඉටු කිරීම සඳහා හිජ්රි හත්වැනි වසරේ ඔවුහු නැවත පැමිණියෝය. එවිට දේව ආදේශකයින් ඇතැමුන් ඇතැමෙකුට දොස් නගමින් ‘නියත වශයෙන්ම මදීනාවෙහි උණ වැළඳී එය ඔවුන් දුර්වලතාවට පත් කළ පිරිසක් නුඹලා වෙත පැමිණෙනු ඇත’ යැයි පැවසුවෝය. ඔවුන්ගේ මෙම ප්රකාශය නබි -සල්ලල්ලාහු අලය්හි වසල්ලම්- තුමා දැනගත් කල්හි එයට ප්රතිචාර දැක්වීමටත් ඔවුන් එසේ නොවන බව ඒත්තු ගැන්වීමටත් සිතූහ. ඒ අනුව එතුමාණන් තම සහගාමීන්ට රුක්නුල් යමානී හා හජ්රුල් අස්වද් ගල පිහිටා ඇති කොන් දෙක අතර හැර සෙසු ස්ථානයන්හි ඉක්මණින් ගමන් කරන මෙන් නියෝග කළහ.එම කොන් දෙක අතර ඔවුන් යන විට ඔවුන් තුළ ආදරයෙන් හා කරුණාවෙන් යුතුව පා ගමනින් ගමන් ගත්හ. එවිට මුස්ලිම්වරුන් තවාෆ් කරනු බලා ගැනීමට 'කඃයික්ආන්' නම් කන්දට නැග ගත් ආදේශකයින් ඔවුන්ව නොදුටුවෝය. එය ඔවුනට රැවටිල්ලක් විය. ඔවුන් මුවන් මෙන් මිස නැතැයි ඔවුන් අතර පවසා ගන්නට විය. මෙසේ ඉක්මණින් ගමන් කිරීම මක්කාවට පැමිණ ඊළඟ වසරේද අනුගමනය කරන්නට විය. එය අපගේ මුතුන් මිත්තන්ට සිදු වූ සිද්ධිය සිහිපත් කිරීමක් වශයෙන් විය. එමෙන්ම ඔවුන්ගේ එම ප්රශංසනීය අවස්ථාව මතක් කිරීමක් වශයෙන් ද ඔවුන්ගේ ඒ දැඩි ඉවසීම මෙනෙහි කිරීමක් වශයෙන් ද. දහමට උදව් කරනු පිණිස හා අල්ලාහ්ගේ ප්රකාශය ඉහළ

නංවනු පිණිස මෙම කීර්තිමත් ක්රියාව ඔවුහු ක්රියාත්මක කළෝය. ඔවුන් අනුගමනය කරන උදවියටත් ඔවුන්ගේ සළකුණින් මදක් දන්වා සිටිනු පිණිසත් අල්ලාහ් එය ප්රදානය කළේය. ඉක්මණීන් ගමන් නොකොට රුක්න් දෙක අතර ගමන් කිරීම වෙනස් කරන ලදී. හේතුව සමුගැනීමේ හජ් වන්දනාවේ එතුමාණන් හජ්රුල් අස්වද් ගල සිට නැවතත් ඒ දක්වා ඉක්මණින් ගමන් කර ඇති බැවිනි. ජාබිර් තුමා හා ඉබ්නු උමර් තුමා විසින් වාර්තා කළ හදීසයක් මුස්ලිම්හි මෙසේ සඳහන් වේ. "සැබැවින්ම අල්ලාහ්ගේ දූතයාණන් සල්ලල්ලාහු අලය්හි වසල්ලම්- තුමා හජ්රුල් අස්වද් ගල සිට නැවතත් එම ගල දක්වා තුන් වරක් ඉක්මණින් ගමන් කළ අතර සිව්වරක් සාමාන්ය ලෙස ගමන් ගත්හ."

http://www.sunnah.global/hadeeth/si/show/3020